# ගාලු උරුමය පදනම

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2015

| පටුන | පිටු අංක |
|---|---|
| 1. දැක්ම, මෙහෙවර, අගයන් | 02 |
| 2. ගාලු උරුමය පදනමෙන් ලබාදෙන සේවාවන් | 03 |
| 3. ගාලු උරුමය පදනම පිහිටුවීම | 04 |
| 4. ගාලු උරුමය පදනම | 05 |
| 4.1 ගාලු කොටුවේ භෞතික පරිසරය | 06-08 |
| 5. ගාලු උරුමය පදනමේ කාර්ය මණ්ඩලය | 09-12 |
| 6. ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය | 13-14 |
| 7. ගාලු උරුමය පදනම මගින් සිදුකරන ලද වැඩසටහන් | 15-21 |
| 7.1 ගාලු උරුමය පදනමේ පනත සංශෝධනය කිරීම | 22 |
| 7.2 දැනුවත් කිරීම් හා සාමාජ සුභ සාධන වැඩසටහන් | 23-25 |
| 7.3 වෙනත් දැනුවත් කිරීම් | 26 |
| 8. මූල්‍ය ප්‍රගතිය | 27 |
| 9. 2015.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය | 28-35 |

# 1.ගාලු උරුමය පදනම

## දැක්ම

"ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම සංස්කෘතික සංචාරක පුරවරය ජීවමාන ලෝක උරුම ගාලු කොටුවයි"

## මෙහෙවර

ඓතිහාසික සංස්කෘතික මධ්‍යස්ථානයක් සහ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ප්‍රදේශයක් ලෙස ගාලු කොටුව සංරක්ෂණය කිරීම හා විශිෂ්ඨතම සංචාරක පුරවරයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.

## අගයන්

- කොටු පවුර හා ගොඩනැගිලි සංරක්ෂණය
- ගාලු කොටුවේ ජාතීන් අතර අන්‍යෝන්‍ය සහයෝගය හා සම්බන්ධීකරණය ඇති කිරීම
- ඓතිහාසිකත්වය ආරක්ෂා කිරීම පිළිබඳ දැනුවත් කිරීම.
- ආකල්ප වර්ධනය
- භෞතික සංවර්ධනය
- සංචාරක පහසුකම ඇති කිරීම හා වැඩිදියුණු කිරීම.
- සංචාරක ආකර්ශනීය ස්ථාන ඇති කිරීම හා සංවර්ධනය කිරීම.
- ගාලු කොටුව නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම.
- ගාලු කොටුවේ ජාතීන් අතර සමානාත්මතාවය වැඩිදියුණු කිරීම.
- පාරම්පරික ජීවනෝපායන් නංවාලීම.
- සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ක්‍රියාකාරකම් විධිමත් කිරීම.
- පාරිභෝගික අගයන් වැඩිකිරීම.
- කාර්යක්ෂම සේවාවක් ලබාදීම.

## 2. ගාලු උරුමය පදනමෙන් ලබාදෙන සේවාවන්

1. ගාලු කොටුව තුල සංචාරක පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
2. ගාලු කොටුව අලංකාරවත්ව පවිත්‍රව පවත්වාගෙන යාම.
3. ගාලු කොටුව තුල ගොඩනැගිලි තැනීම, වෙනස් කිරීම කළමනාකරණය කිරීම සඳහා ගාලු කොටුව සැලසුම් කමිටුව සමඟ කටයුතු කිරීම.
4. ගාලු කොටුව තුල පිහිටි පොදු ස්ථාන උත්සව සඳහා වෙන් කර දීම.
    - උසාවිය ඉදිරිපිට එළිමහන් රංග භූමිය
    - සුධර්මාලය විහාරය අසල රැම්පාට් භූමිය
    - සඳු අට්ටාලය
5. ගාල්ල කොටුව පිළිබඳ දැනුවත් කිරිමේ දේශන හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම.
6. ගාල්ල කොටුව තුල ජංගම වෙළඳුන් ලියාපදිංචි කිරීම හා ජංගම වෙළඳාම විධිමත් කිරීම.
7. ගාලු කොටුව තුළට අවශ්‍ය රථවාහන සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
8. ගාල්ල කොටුව තුල ජංගම ආරක්ෂක සේවාවක් පවත්වාගෙන යාම.
9. ගාල්ල කොටුව පිළිබඳ තොරතුරු ඇතුලත් තොරතුරු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම හා "උල්පත" විමර්ශන පුස්තකාලය පවත්වාගෙන යාම.
10. වර්ෂය පුරා සංස්කෘතිකමය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
11. ගාලු කොටුව තුල යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
12. ගාලු කොටුව තුල රැගත කිරීම් කළමනාකරණය කිරීම.

## ගාලු උරුමය පදනම පිහිටුවීම

❖ පනතේ සඳහන් පරිදි ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ආරක්ෂාකිරීම, සංරක්ෂණය කිරීම සංවර්ධනය කිරීමත්, එහි දේපල සම්බන්ධයෙන් කටයුතු කිරීමත් පදිංචිකරුන්ගේ සුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීමත් මූලික අරමුණු වේ. (පණතේ 03 වන වගන්තිය පරිදි)

❖ පනතට අනුව ගාලු උරුමය පදනමේ කටයුතු සම්බන්ධ අමාත්‍යවරයා යන්නෙන් ව්‍යවස්ථාවේ 44 වන වගන්තිය යටතේ පත්කරනු ලැබුවා වූ ද සංස්කෘතික කටයුතු පිළිබඳ විෂයය පවරනු ලැබුවා වූ ද අමාත්‍යවරයා බව සඳහන් කර ඇත.

❖ ඒ අනුව 2015 වර්ෂය වන තුරු ගාලු උරුමය පදනම සංස්කෘතික කටයුතු භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය.

❖ 2015 වර්ෂයේදී සිදුවූ නව අමාත්‍ය මණ්ඩල පත් කිරීම් සමඟ 2015 ජනවාරි මස 22 වන දින ගාලු උරුමය පදනම සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතට පත්විය.

❖ නැවත වතාවක් සිදුවූ අමාත්‍ය මණ්ඩල වෙනස්වීම් සමඟ 2015 සැප්තැම්බර් මස 21 වන දින ගාලු උරුමය පදනම අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පත්විය.

❖ 2015 නොවැම්බර් මස 21 වන දින අති විශේෂ ගැසට් පත්‍රය මඟින් දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වූ එකම ආයතනය ලෙස ගාලු උරුමය පදනම නම් කරනු ලැබීය.

❖ නැවත වතාවක් 2015.09.24 වන දින සිදු වූ අමාත්‍ය මණ්ඩල සංශෝධනයට අනුව ගාලු උරුමය පදනම නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

# 4. වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2015

## ගාලු උරුමය පදනම

1994 අංක 07 දරණ පාර්ලිමේන්තු පනත මගින් පිහිටවනු ලැබූ ගාලු උරුමය පදනම ව්‍යවස්ථාපිත ආයතනයකි.

### ගාලු උරුමය පදනමට අයත් භූමි ප්‍රදේශය

*යුනෙස්කෝ ආයතනය මගින් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ගාලු කොටුව ගාලු උරුමය පදනමේ වපසරියට අයත් වේ. මුර අට්ටාල 14කින් සමන්විත මෙම කොටුවේ කොටු බැම්මේ දිග ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී. 2.5ක් පමණය.*

### ලෝක උරුම ගාලු කොටුවේ සිතියම




❖ ගාලු උරුමය පදනම මගින් සංරක්ෂණය කොට ගැලරියක් බවට පරිවර්තනය කරනු ලැබ ඇත්තේ සඳු අට්ටාලයේ පිහිටි යුධ කාමරයකි.

## *4.1 ගාලු කොටුවේ භෞතික පරිසරය*

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශය තුළ පිහිටි 96ඩී ග්‍රාමසේවා වසම ගාලු කොටුව අයත් ප්‍රදේශය වේ. ප්‍රමාණයෙන් අක්කර 80.9067 (හෙක්ටෙයාර් 32.7418) ක භූමි භාගයකින් ගාලු කොටුව සමන්විත වේ.

## *ගාලු කොටුවේ ජනගහන තොරතුරු - 2011*

(තොරතුරු - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුවේ වෙබ් අඩවිය )

| සිංහල | ශ්‍රී ලංකා දෙමළ | ඉන්දියානු දෙමළ | ශ්‍රී ලංකා මුස්ලිම් | බර්ගර් | මැලේ | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 501 | 17 | 07 | 531 | 0 | 0 | 2 | 1058 |



***ගාලු කොටුවේ තොරතුරු 2015.01.01 සිට 2015.12.31 දක්වා (කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සම්පත් පැතිකඩ ඇසුරෙනි.***

## ජාතීන් අනුව ජනගහනය

| | සිංහල | ද්‍රවිඩ | මුස්ලිම් | බර්ගර් | මැලේ | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජනගහනය | 731 | 22 | 892 | 21 | 20 | - | 1686 |




## *මුළු ජනගහනය*

| ස්ත්‍රී | පුරුෂ | මුළු ජනගහනය | මුළු පවුල් ප්‍රමාණය |
|---|---|---|---|
| 913 | 773 | 1686 | 333 |



## වයස් කාණ්ඩ අනුව ජනගහනය

| අවු: 0 - 4 | | | අවු: 5 - 17 | | | අවු: 18 - 60 | | | අවු: 61ට වැඩි | | | මුළු ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
| 49 | 43 | 92 | 204 | 169 | 373 | 489 | 397 | 886 | 171 | 164 | 335 | 913 | 773 | 1686 |

## වයස් කාණ්ඩ අනුව ජනගහනය

| අවු: 0-4 | අවු: 5-10 | අවු: 11-20 | අවු: 21-30 | අවු: 31-40 | අවු: 41-50 | අවු: 51-60 | අවු: 60 වැඩි | මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| 92 | 130 | 228 | 219 | 226 | 231 | 225 | 335 | 1686 |

## ආගම අනුව ජනගහනය සහ පවුල් බෙදීයාම

| | බෞද්ධ | හින්දු | ඉස්ලාම් | රෝමානු කතෝලික | වෙනත් ක්‍රිස්තියානි | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජනග්‍රහනය | 715 | 22 | 892 | 21 | 36 | - | 1686 |
| පවුල් ගණන | 141 | 06 | 179 | 04 | 03 | - | 333 |

## කොටුවේ මුළු භූමි ප්‍රමාණය

| විස්තරය | බිම් ප්‍රමාණය (අක්කර) | මුළු බිම් ප්‍රමාණය |
|---|---|---|
| ගොඩනැගිලි | 87.75 | 91.40% |
| පාරවල් | 1.125 | 1.17% |
| වෙනත් | 7.125 | 7.42% |



## 5. 2015 වර්ෂය තුළ ගාලු උරුමය පදනමේ කාර්යය මණ්ඩලය

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | රමාා සිරිවංශ මහතා | සභාපති |
| 2. | එච්.එල්. ගුණවර්ධන මහතා | අධ්‍යක්ෂ |
| 3. | සීතා පී. ලියනගේ මිය | පරිපාලන නිලධාරී |
| 4. | ඒ.කේ.පී.කේ. ජයසිරි මයා | ගිණුම් නිලධාරී |
| 5. | එල්.ඒ. තරංග පුෂ්ප කුමාර මයා | ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සහකාර (සැලසුම්) තනතුරට අනුයුක්ත සංවර්ධන සහකාර |
| 6. | එස්.පී. ලොකුලියන මිය | ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සහකාර (සැලසුම්) තනතුරට අනුයුක්ත සංවර්ධන සහකාර |
| 7. | පී.ජී.එන්. චන්දිමාලි මිය | ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සහකාර (සැලසුම්) තනතුරට අනුයුක්ත සංවර්ධන සහකාර |
| 8. | බී.එස්. ඉලේපෙරුම මිය | කළමනාකරණ සහකාර |
| 9. | පියුමි රේඛානි මෙනවිය | කළමනාකරණ සහකාර |
| 10. | මාපලගම හේවමානගේ ඉෂානි ප්‍රියදර්ශනී මෙනවිය | කළමනාකරණ සහකාර |
| 11. | ඩිලානි හර්ෂිකා වික්‍රමසූරිය මෙනවිය | කළමනාකරණ සහකාර |
| 12. | මොහොමඩ් හම්සා ෆාතිමා ෆවුසානා | කළමනාකරණ සහකාර |
| 13. | එම්.ඊ. නෙවිමාල් ශිරන්ත ද සිල්වා මයා | රියදුරු |
| 14. | එම්.එල්.එස්. ජයසේකර මයා | ආරක්ෂක නියාමක |
| 15. | ඩබ්.ජී. නන්දන සමන් මයා | ආරක්ෂක නියාමක |
| 16. | ඒ.ජී. සමන් කුමාර මයා | කාර්යාල කාර්ය සහයක |

| තනතුර | වැටුප් සංකේත අංකය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|---|
| සභාපති | පීඩී 3/2015 චක්‍රලේඛය පරිදි දීමනා ගෙවා ඇත | 01 | 01 |
| අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී | එම්එම් 1-1 | 01 | 01 |
| පරිපාලන නිලධාරී | ජේ එම් 1-1 | 01 | 01 |
| ගිණුම් නිලධාරී | ජේ එම් 1-1 | 01 | 01 |
| සංවර්ධන සහකාර (ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සහකාර සැලසුම් තනතුරට අනුයුක්ත) | එම් එන් 4 | 02 | 01 |
| සංවර්ධන සහකාර (ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සහකාර තොරතුරු මධ්‍යස්ථාන තනතුරට අනුයුක්ත) | එම් එන් 4 | 01 | 01 |
| සංවර්ධන සහකාර (ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සහකාර වැඩසටහන් සම්බන්ධීකරණ තනතුරට අනුයුක්ත) | එම් එන් 4 | 02 | 01 |
| ව්‍යාපෘති සහකාර (ගිණුම්) | එම් ඒ 3 | 01 | - |
| කළමනාකරණ සහකාර | එම් ඒ 1-1 | 04 | 04 |
| රියදුරු | පී එල් 3 | 01 | 01 |
| කාර්යාල කාර්ය සහයක | පී එල් 1 | 01 | 01 |
| ආරක්ෂක නියාමක | පී එල් 1 | 04 | 02 |

## ගාලු උරුමය පදනමේ කාර්ය මණ්ඩලයේ සේවා කාලය පිළිබඳ තොරතුරු

| අනු අංකය | නම | තනතුර | සේවා කාලය |
|---|---|---|---|
| 1. | රම්‍ය සිරිවංශ මයා | සභාපති | 2015.02.09 සිට 2016.02.29 දක්වා |
| 2. | එච්.එල්. ගුණවර්ධන මයා | අධ්‍යක්ෂ | 2007.04.11 සිට මේ දක්වා |
| 3. | සීතා පී. ලියනගේ මිය | පරිපාලන නිලධාරි | 2006.01.02 සිට මේ දක්වා |
| 4. | ඒ.කේ.පි.කේ. ජයසිරි මයා | ගිණුම් නිලධාරී | 2005.11.14 සිට මේ දක්වා |
| 5. | එල්.ඒ. තරංග පුෂ්ප කුමාර මයා | ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සහකාර (සැලසුම්) තනතුරට අනුයුක්ත සංවර්ධන සහකාර | 2006.08.01 සිට මේ දක්වා |
| 6. | පී.ජී.එන්. චන්දිමාලි මිය | ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සහකාර (සැලසුම්) තනතුරට අනුයුක්ත සංවර්ධන සහකාර | 2006.08.01 සිට මේ දක්වා |
| 7. | එස්.පී. ලොකුලියන මිය | ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සහකාර (සැලසුම්) තනතුරට අනුයුක්ත සංවර්ධන සහකාර | 2015.04.28 සිට මේ දක්වා |
| 8. | බී.එස්. ඉලේපෙරුම මිය | කළමනාකරණ සහකාර (තා.නො.) | 2015.11.02 සිට මේ දක්වා |
| 9. | පියුමි රේඛානි මෙනවිය | කළමනාකරණ සහකාර (තා.නො.) | 2012.12.03 සිට 2015.09.15 දක්වා |
| 10. | ඩිලානි හර්ෂිකා වික්‍රමසූරිය | කළමනාකරණ සහකාර (තා.නො.) | 2015.09.01 සිට මේ දක්වා |
| 11. | එම්.එච්.එම්. ඉෂානි ප්‍රියදර්ශනී මෙනවිය. | කළමනාකරණ සහකාර (තා.නො.) | 2015.09.01 සිට මේ දක්වා |
| 12. | එම්.එච්. ෆාතිමා ෆවුසානා මිය | කළමාකරණ සහකාර (තා.නො.) | 2015.09.16 සිට මේ දක්වා |
| 13. | නෙව්මාල් ශිරන්ත ද සිල්වා මයා | රියදුරු | 2012.12.03 සිට මේ දක්වා |
| 14. | ඒ.ජී. සමන් කුමාර මයා | කාර්යාල කාර්ය සහායක | 2012.12.03 සිට මේ දක්වා |
| 15. | එම්.එල්.එස්. ජයසේකර මයා | ආරක්ෂක නියාමක | 2012.12.03 සිට මේ දක්වා |
| 16. | ඩබ්.ජී. නන්දන සමන් මයා | ආරක්ෂක නියාමක | 2012.12.03 සිට මේ දක්වා |

# 2015 වසරේ කාර්ය මණ්ඩලයේ ඇතිවූ වෙනස්වීම්

- සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ සංවර්ධන සහකාර ලෙස පත්වීම් ලැබූ එස්.පී. ලොකුලියන මිය 2015.04.28 වන දින ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සහකාර (සැලසුම්) තනතුර සඳහා අනුයුක්තව සේවයට එක්ව සිටී.

- 2015.08.24 වන දින පත්වන ලද සම්මුඛ පරීක්ෂණයන් මගින් ගාලු උරුමය පදනම සඳහා පහත සඳහන් කළමනාකරණ සහකාරවරු (තා.නො.) තිදෙනා බඳවා ගන්නා ලදි.

| නම | | පත්වීම් ලැබූ දිනය |
|---|---|---|
| ඩිලානි හර්ෂිකා වික්‍රමසූරිය මෙනවිය | - | 2015.09.01 |
| එම්.එච්.එම්. ඉෂානි ප්‍රියදර්ශනී මෙනවිය | - | 2015.09.01 |
| එම්.එච්. ෆාතිමා ෆවුසානා මිය | - | 2015.09.16 |

- 2012.12.03 වන දින සිට ගාලු උරුමය පදනමේ කළමනාකරණ සහකාර (තා.නො.) ලෙස සේවය කළ පියුමි රේඛානි මෙනවිය රාජ්‍ය සේවයට එක්වීම සඳහා 2015.09.15 වන දින ගාලු උරුමය පදනමෙන් ඉවත්වෙන ලදි.

## ගාලු උරුමය පදනමේ සේවය කල සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ පරිපාලන නිලධාරීන්ගේ තොරතුරු

### ගාලු උරුමය පදනමේ සභාපති තනතුර දැරූ අයගේ තොරතුරු

| අනු අංකය | නම | තනතුරට පත්වූ වසර | සේවාව අවසන් කළ වර්ෂය |
|---|---|---|---|
| 1. | රූපා කරුණාතිලක මැතිතුමා ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය | 1989 | 1994 |
| 2. | නෙවිල් කනකරත්න මැතිතුමා දකුණු පළාත් ගරු ආණ්ඩුකාර | 1994 | 2000 |
| 3. | ආචාර්ය රිචඩ් පතිරන මැතිතුමා | 2000 | 2002 |
| 4. | රියෙන්සි විජේතිලක මැතිතුමා (සභාපති, හැටන් නැෂනල් බැංකුව) | 2002 | 2003 |
| 5. | වජිර අබේවර්ධන මැතිතුමා ගරු රාජ්‍ය පරිපාලන කටයුතු අමාත්‍ය | 2003 | 2004 |
| 6. | ජී.එච්. අජිත් කුමාර මැතිතුමා ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී | 2004 | 2007 |
| 7. | පරාක්‍රම දහනායක මැතිතුමා (නාගරික මන්ත්‍රී, ගාල්ල මහ නගර සභාව) | 2007 | 2015 |
| 8. | රම්‍ය සිරිවංශ මැතිතුමා (විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්) | 2015.02.19 | 2016.02.29 |

### ගාලු උරුමය පදනමේ ප්‍රධාන විධායක නිලධාරී ධූරය දැරූවන්ගේ තොරතුරු

| අනු අංකය | නම | තනතුරට පත්වූ වසර | සේවාව අවසන් කළ වර්ෂය |
|---|---|---|---|
| 1. | පී. හේවාවසම් මහතා හිටපු දිසාපති, ගාල්ල | 2001.12.15 | 2004.04.01 |
| 2. | පී. විජේරත්න මහතා (හිටපු අතිරේක දිසාපති, ගාල්ල) | 2004.06.28 | 2005.12.31 |
| 3. | එන්.ඩබ්.එන් ද සිල්වා මහතා (හිටපු ප්‍රාදේශීය කළමනාකරු ලංකා බැංකුව) | 2006.01.12 | 2007.02.28 |
| 4. | එච්.එල්. ගුණවර්ධන මහතා (හිටපු ප්‍රාදේශීය ලෙක්ම්, ගාල්ල කඩවත්සතර) | 2007.04.11 | මේ දක්වා |

### ගාලු උරුමය පදනමේ පරිපාලන නිලධාරී තනතුර දැරූ අයගේ තොරතුරු

| අනු අංකය | නම | තනතුරට පත්වූ වසර | සේවාව අවසන් කළ වර්ෂය |
|---|---|---|---|
| 1. | හේමනාත් ගුණවර්ධන මහතා | 2001.03.01 | 2003.10.31 |
| 2. | පී.ඒ. කරුණාසේන මහතා | 2004.03.25 | 2005.12.31 |
| 3. | සීතා පී. ලියනගේ මහත්මිය | 2006.01.02 | මේ දක්වා |

# 6. ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය

ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය පදනමේ පනත මගින් "කළමනාකරණ මණ්ඩලය" වෙත පවරනු ලැබ ඇත. (පණතේ 05 වන වගන්තිය පරිදි)

ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

## ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් 2015

## නිල බලයෙන් පත්වූ සාමාජිකයන් :-

| අනු අංකය | තනතුර | ලිපිනය |
|---|---|---|
| 1. | දිස්ත්‍රික් ලෙක්ම් (උප සභාපති - ගාලු උරුමය පදනම) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| 2. | පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07. |
| 3. | සභාපති නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය, අංක 07, සෙත්සිරිපාය, බත්තරමුල්ල. |
| 4. | සභාපති, ශ්‍රී ලංකා වරාය අධිකාරිය | ශ්‍රී ලංකා වරාය අධිකාරිය, චෛත්‍ය පාර, අංක 19, කොළඹ 01. |
| 5. | අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල | මධ්‍යම සංස්කෘතික අරමුදල, අංක 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. |
| 6. | අධ්‍යක්ෂ, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, 04 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. |
| 7. | ප්‍රාදේශීය ලේකම් | කඩවත්සතරප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගාල්ල. |
| 8. | ගරු නගරාධිපති | මහ නගර සභාව, ගාල්ල. |
| 9. | අධ්‍යක්ෂ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, අංක 407, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. |
| 10. | සභාපති, ජාතික ජලජ සම්පත් ආයතනය (නාරා) | ජාතික ජලජ සම්පත් ආයතනය (නාරා), කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15. |
| 11. | අධ්‍යක්ෂ ස්මාරක සංරක්ෂණය පිළිබඳ වාස්තු විද්‍යා අධ්‍යයන අංශය | වාස්තු විද්‍යා අධ්‍යයන අංශය, මොරටුව විශ්ව විද්‍යාලය, මොරටුව. |
| 12. | දකුණු පළාත් සංස්කෘතික අමාත්‍ය | දක්ෂිණ පාය, ලබුදූව, ගාල්ල. |
| 13. | අධ්‍යක්ෂ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07. |
| 14. | සභාපති, ශ්‍රී ලංකා නෙදර්ලන්ත මිත්‍රත්ව සංගමය | ශ්‍රී ලංකා නෙදර්ලන්ත මිත්‍රත්ව සංගමය, අංක 95, කුමාර විදිය, කොළඹ 11. |

## නිල බලයෙන් පත්වූ සාමාජිකයන් විසින් තෝරාපත්කර ගන්නා ලද "තොරාපත් කළ සමාජිකයන්"

| අනු අංකය | නම | තනතුර | ලිපිනය | කළමනාකරණ මණ්ඩලයට පත්වූ දිනය |
|---|---|---|---|---|
| 15. | එන්.ඒ.එන්. සරත්සේන මහතා | දකුණු ප්‍රදේශ භාර නාවික ආඥාපති | දක්ෂිණ නාවික කඳවුර, දකුණු නාවික පෙදෙස, මාගාල්ල, ගාල්ල. | 2015.05.21 |
| 16. | එච්.ඩබ්. විජේරත්න මහතා | සභාපති දකුණු පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභාව | 06 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. | 2015.06.21 |
| 17. | ලාල් සමරසේකර මහතා | ආණ්ඩුකාර ලේකම් | ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, පහල ඩික්සන් පාර, ගාල්ල. | 2015.07.17 |
| 18. | ඇෂ්ලි ද වොස් මහතා | ගෘහ නිර්මාණ ශිල්පී උපදේශක | අංක 131, ඩබ්.ඒ.ඩී. රාමනායක මාවත, කොළඹ 02. | 2015.05.21 |
| 19. | පී. සාලිය ද සිල්වා මහතා | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය, ගාල්ල. | 2015.06.21 |
| 20. | කර්නල් ඩයස් මහතා | 581 වන බලසේනාධිපති | 581 වන බලසේනා මූලස්ථානය, බූස්ස. | 2015.06.21 |

## අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන්

| අනු අංකය | නම | තනතුර | ලිපිනය | කළමනාකරණ මණ්ඩලයට පත්වූ දිනය |
|---|---|---|---|---|
| 21. | රම්‍ය සිරිවංශ මහතා | සභාපති ගාලු උරුමය පදනම | නො 737/1, පන්නිපිටිය පාර, බත්තරමුල්ල. | 2015.02.19 |
| 22. | සිසිර අමරසිංහ මහතා | පත්කල සාමාජික | තොටමුන පාර, මාතර. | 2015.02.19 |
| 23. | එල්.කේ. ආරියරත්න මහතා | පත්කල සාමාජික | නො 10/2, "දීපානි", ශ්‍රී විජයාරාම පාර, කලුවඩුමුල්ල, අම්බලන්ගොඩ. | 2015.02.19 |
| 24. | නීතිඥ පී.එච්. විමලරත්න මහතා | පත්කල සාමාජික | අංක 113, සන්සයිඩ් වත්ත, උළුවිටිකේ, ගාල්ල. | 2015.02.19 |
| 25. | චන්ද්‍ර නානායක්කාර මහතා | පත්කල සාමාජික | අංක 09, දෙවට පාර, නූපේ, මාතර. | 2015.02.19 |
| 26. | කේ.ඊ. ජයසිංහ මහත්මිය | පත්කල සාමාජික | 184/2, එදිරිසිංහ පාර, කිතුලම්පිටිය, උළුවිටිකේ, ගාල්ල. | 2015.02.19 |

# 7. ගාලු උරුමය පදනම මගින් සිදු කරන ලද වැඩසටහන්

## සංස්කෘතික වැඩසටහන්

### 2015.01.01 - නව වසර සැමරීම

නව වසරේ ආරම්භක ජනවාරි 01 වන දින රාජකාරී කටයුතු ආරම්භයට ප්‍රථමව, කාර්යාලයේ සියළුම නිලධාරීන් හා සහෝදර ආයතන නිලධාරීන්ගේද සහභාගීත්වය ඇතිව ආගමික වතාවත්වල යෙදෙමින් කෙටි පිරිත් සජ්ඣායනයක් ශ්‍රවනය කර එහි ආශිර්වාද ලබාගෙන සියලු දෙනා එක්ව කැවිලි පෙට්ටිවලින් යුතු සංග්‍රහයක් භුක්තිවිඳ සතුටින් සාමයෙන් සුහදව රාජකාරී කටයුතු ආරම්භ කරන ලදි. මෙය ගාලු උරුමය පදනම විසින් කරනු ලබන සංස්කෘතිකමය වැඩසටහනක් වන අතර, සියළු වියදම් නිලධාරීන්ගේ පෞද්ගලික වියදමිනි.




### 2015.01.15 - තෛපොංගල් උත්සවය

ජාතික සංහිඳියාව හා සහයෝගීත්වයෙන් එක්ව වැඩකිරීමේ අරමුණු පෙරදැරි කරගෙන ජනතාව අති උත්කර්ශවත් අන්දමින් පවත්වනු ලබන තෛපොංගල් උත්සවය ගාලු උරුමය පදනමේ සහයෝගීතාවයෙන් බෞද්ධ ආගමික නායකයින්ගේ ද සහභාගීත්වයෙන් ගාල්ල කදිරවේලායුධ කෝවිලේදී අති උත්කර්ශවත් අන්දමින් පවත්වන ලදි. මේ සඳහා අපගේ ආරාධනයෙන් රාජ්‍ය නිලධාරීන් ඇතුළු 100කට අධික පිරිසක් සහභාගී වූහ. එම පූජාව අවසානයේ ගාලු උරුමය පදනමේ අනුග්‍රහය යටතේ ඒ සියලුම දෙනා වෙනුවෙන් තේ පැන් සංග්‍රහයක් ද ලබාදෙන ලදි.



ගාලු උරුමය පදනමේ සංස්කෘතිකමය වැඩසටහනක් ලෙස මෙය වාර්ෂිකව සංවිධානය කරනු ලබන අතර, මෙවරද එම වැඩසටහනට දායකත්වය ලබාදුන් අතර, මේ සඳහා **රු.10,000.00**ක් මුදලක් වැය කෙරිණි.



## ***2015.04.15 නව වසරේ හිසතෙල්ගෑමේ උත්සවය***

සිංහල දෙමළ අලුත් අවුරුද්දේ සිදුකරන පාරම්පරික චාරිත්‍ර ක්‍රමවේදයක් ලෙස හිසතෙල් ගෑමේ චාරිත්‍රය වාර්ෂිකව සිදු කෙරෙද්දී ගාලු උරුමය පදනම ඒ සඳහා මූලිකත්වය ලබාදෙමින් පාරම්පරික වෛද්‍යවරුන්ගේ දායකත්වය ලබාගෙන ගාල්ල උසාවි චතුරස්‍රයේදී 250කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් මෙම උත්සවය චාරිත්‍රානුකූලව සිදු කරන ලදි. මෙහිදී විදේශිකයන්ගේ සහභාගීත්වය ද විශේෂිත වූහ. පැමිණි සියලු දෙනාටම ඖෂධීය බෙලිමල් පානයකින් සංග්‍රහ කරන ලදි. මෙම අවස්ථාව වර්ණවත් කිරීම සඳහා පහතරට නර්තන සම්ප්‍රදායේ සුවිශේෂී නර්තන අංග සහිත සංස්කෘතික සංදර්ශනයක් ද පවත්වන දි. මෙම උත්සවය සඳහා වැයවූ මුදල **රු.40,865.00**කි.





## ***2015.05.12 - ධර්ම දේශනය***

මහව ගල්ලෑව වෙහෙර ආරණ්‍ය සේනාසනයේ සහ මාවතගම දොඩන්තලාව ආරණ්‍ය සේනාසනාධිපති විනයාචාර්යය, කම්මට්ඨානාචාර්යය පූජ්‍ය උඩුදුම්බර කාශ්‍යප හිමි විසින් පවත්වනු ලැබූ සුමධුර ධර්ම දේශනාවක් 2015.05.12 වන දින පස්වරුවේදී ගාල්ල හෝල් ඩී ගෝල් ශාලාවේදී පවත්වනු ලැබිය. මේ සඳහා රු.**30,000.00**ක පරිත්‍යාගයක් ලැබුණු අතර, රු.3,921/-ක මුදලක් ගාලු උරුමය පදනමෙන් දරා ඇත.




## ***2015.09.04,05,06 දින සර්වඥ ධාතු ප්‍රදර්ශනය***

අම්පාරේ නීලගිරි සෑයේ කැණීම්වලින් සොයාගන්නා ලද ශර්වඥ ධාතූන් වහන්සේලා කොටුව ශ්‍රී සුධර්මාලය විහාරස්ථානයට වැඩමවා මහජනයාට පුද සත්කාර කිරීමට අවස්ථාව ලබාදුනි. මේ සඳහා ගාල්ල හා අවට ප්‍රදේශවලින් මෙන්ම දුර බැහැරින් ද විශාල බැතිමතුන් පිරිසක් සහභාගී වූ අතර, ත්‍රිවිධ හමුදාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දකුණු පළාත් සංස්කෘතික අමාත්‍යංශය ආදී ආයතනවල සහයෝගය ලබාගන්නා ලදී. මේ සඳහා වූ වියදම රු.83,390.00කි.




## සංවර්ධන වැඩසටහන්

### සිප්නාරා ගොඩනැගිල්ල ඉදිරිපිට කාණුව අලුත්වැඩියා කිරීම

ගාල්ල කොටුවේ බාලදක්ෂ මාවතේ පිහිටි "සිප්නාරා" ගොඩනැගිල්ලේ කොටසක ගාලු උරුමය පදනම මගින් අපන ශාලාවක් පවත්වාගෙන යාම සඳහා බදු දී ඇත. මේ ගොඩනැගිල්ල ඉදිරිපස ඇති කාණුව සකස් කිරීම මෙම වසරේදී සිදු වූ අතර, ඒ සඳහා රු.**251,417.00** ක මුදලක් වැය කරන ලදි.



සංරක්ෂණයට පෙර



සංරක්ෂණයෙන් පසු

### තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම

ගාල්ල කොටුවේ බාලදක්ෂ මාවතේ පිහිටි ප්‍රදේශීය ලේකම් කාර්යාලය සතුව පැවති දිරාපත්වූ ගොඩනැගිල්ලක් ගාලු උරුමය පදනම වෙත පවරාගෙන ඇලුත්වැඩියා කරන ලදි. එසේ අලුත්වැඩියා කටයුතු නිමකරන ලද ගොඩනැගිල්ල තුළ 2014 වසරේදී "උරුම කේන්ද්‍රය" නමින් තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදි. ඒ සමගම "උල්පත" විමර්ශන පුස්තකාලය ද මෙම ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කරනු ලැබූ අතර, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ අනුග්‍රහයෙන් ඉන්දියානු ගැලරියක් ද මෙම ගොඩනැගිල්ලේ පිහිටුවා ඇත.



මෙම තොරතුරු මධ්‍යස්ථානයෙන් ගාල්ල කොටුව පිළිබඳ තොරතුරු ලබා ගැනීමට විශාල පිරිසක් දිනපතා පැමිණෙති. මෙම ගොඩනැගිල්ලේ ඉතිරිව තිබූ වැඩ කටයුතු කිහිපයක් මෙම වසරේදී ද කිරීමට සිදු වූ අතර, මේ සඳහා වැයකළ මුදල රු. **198,262.00**කි.

## සන්ධ්‍යාර කුළුණ අලුත්වැඩියා කිරීම

ගාලු කොටුවේ පිහිටි ලන්දේසි සන්ධ්‍යාර කුළුන ලන්දේසි ගබඩා ගොඩනැගිල්ල ඉදිරිපිට කොටු බැම්ම මත පිහිටා ඇත. ලන්දේසීන් විසින් 18 වන සියවසේ මුල් අවධියේ ඉදිකර ඇති මෙය ඔරලෝසු කණුවක් වශයෙන් ඉදිකරනු ලැබූවකි. පසුගිය අවුරුදු 05ක කාලය තිස්සේ සන්ධ්‍යාර කුළුණ අබලන් තත්ත්වයේ පැවති අතර, ගාලු උරුමය පදනම විසින් මේ වසරේදී එහි සංරක්ෂණ කටයුතු කරන ලදි. ඒ සඳහා රු. **807,275.00**ක වියදමක් දරා ඇත.



සංරක්ෂණයට පෙර



සංරක්ෂණයෙන් පසු

## ඔරලෝසු කණුව අලුත්වැඩියා කිරීම 2015.10.22 වන දින සිට

ගාලු ඔරලෝසු කණුව යනු ගාල්ල කොටුවේ බ්‍රිතන්‍ය ඉතිහාසයේ වාස්තු විද්‍යාත්මක අංගයකි. එහි ඉහල කොටස අකුණු ගැසීම නිසා හානියට පත්විය. ඔරලෝසු කණුව සංරක්ෂණය කිරීම උදෙසා පරිපූර්ණ සංරක්ෂණ ව්‍යාපෘතියක් ගාලු උරුමය පදනම මගින් 2015.10.22 වන දින ආරම්භ කරන ලදි. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය මගින් මෙහි සංරක්ෂණ කටයුතු සිදු කරනු ලබයි. ඒ සඳහා මේ වසරේදී දරා ඇති වියදම රු. **4,892,148.00**කි.



*සංරක්ෂණයේ මුල් අවස්ථාව*



*සංරක්ෂණයේ පසු අවස්ථාව*

## සඳු අට්ටාලයේ යුධ කාමරය වායු සමීකරණයකිරීම සහ විදුලිය සැපයීම

ගාලු කොටුව සඳු අට්ටාලය මත පිහිටි ලන්දේසි අවදියේ ඉදිකල යුධකාමර 02ක ගාලු උරුමය පදනම විසින් පසුගිය වර්ෂ 02ක මුළුල්ලේ සංරක්ෂණය කරනු ලැබූ අතර, ගාල්ල ඉතිහාසය පිළිබිඹු වන ගැලරියක් ස්ථාපනය කිරීමට මෙය යොදා ගනු ලැබේ. ඒ අනුව ගාලු ඉතිහාසයේ විවිධ සිදුවීම් නිරූපනය වන සිතුවම් 16ක් ද ප්‍රතිමා 12ක් ද අදාල පරිශ්‍රය තුල ස්ථාපනය කරනු ලැබීය. මෙහි අභ්‍යන්තර සැකසුම් කටයුතු සිදු කරන අතර, වායු සමීකරණය කිරීම, ආලෝකකරණය කිරීම ආදිය ඒ සඳහා ඇතුලත් වේ. ඒ සඳහා දරා ඇති වියදම රු.**1,436,586.00**කි.





## වෙනත් වැඩසටහන්

### කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම

යුනෙස්කෝ සංවිධානයේ නිර්දේශයන් සම්පූර්ණ කිරීම උදෙසා ලෝක උරුම ගාලු කොටුව සඳහා විධිමත් කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය දිගු කලක් තිස්සේ පැවතුණි. මෙම සැලැස්ම සකස් කිරීම සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීම මත ගාලු උරුමය පදනමට භාරවී තිබිණ. ඒ අනුව 2014 වර්ෂයේදී මෙහි කටයුතු ආරම්භ කළ අතර, මෙම වසරේදී එම කටයුතු නිම කිරීමට හැකි විය. මෙකී සැලැස්ම ගාල්ල කොටුවේ පදිංචි දෙස් විදෙස් ප්‍රජාවගේ අදහස් හා යෝජනා සහිතව සකස් කරනු ලැබ ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රශාන්ත බී.මණ්ඩාවල මහතා විසින් සකස් කළ මෙම කළමනාකරණ සැලැස්ම යුනෙස්කෝ ආයතනයේ පිළිගැනීමට ලක්වී ඇත.

ඒ අනුව මෙතෙක් කල් ගාලු කොටුවේ කළමනාකරණය සඳහා ප්‍රබල අඩුවක් ව පැවති කළමනාකරණ සැලැස්මක අවශ්‍යතාව සම්පූර්ණ වී ඇත. ඉදිරියේදී ගාලු උරුමය හා සම්බන්ධ සියළුම ආයතන මෙකී සැලැස්මේ වැඩකටයුතු අරමුණු, ඉලක්ක සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් මෙහෙයවීමේ වගකීම ගාලු උරුමය පදනම සතුවේ. මේ සඳහා වියදම සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය විසින් දරන ලදි.

## *7.1ගාලු උරුමය පදනමේ පනත සංශෝධනය කිරීම*

ගාලු උරුමය පදනමේ පනතේ සඳහන් පරිදි යම් යම් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදීමට හැකියාව ඇත. මෙම නියෝග සෑදීමට පෙර පනත බලගන්වනු සඳහා පනත සංශෝධනය කළ යුතු බවට නීති කෙටුම්පත් සම්පාදක මගින් ලබාදී උපදෙස් පරිදි පනත සංශෝධනය කිරීම මීට පෙරදී ආරම්භ කරන ලදි.

ඒ අනුව සංශෝධනයට අදාළව සකස් කළ යෝජනා ඇතුළත් සී ඒ/08/2015 දරණ ආමත්‍ය මණ්ඩල සංදේශය නිර්දේශ කර 2015 වර්ෂයේ මැයි මාසයේදී අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. මෙහි ඉදිරි කටයුතු ඉදිරියේදී නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

## *2015 වසරේ කළමනාකරණ මණ්ඩල කමිටු රැස්වීම්*

2015 වසරේ ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 10ක් පවත්වා ඇත. මෙම රැස්වීම් වාර වලදී ගාලු උරුමය පදනමේ කටයුතු සම්බන්ධ ඉතා වැදගත් තීන්දු හා තීරණ ගැනීමට හැකියාව ලැබී ඇත.

## 7.2දැනුවත් කිරීම් සහ සමාජ සුභ සාධන වැඩසටහන්

### 2015.01.03 - පුහුණු වැඩසටහන

හින්දු භාෂාව හා භාරත සංගීතය හදාරන සිසුන් වෙනුවෙන් සංගීත පුහුණු වැඩසටහනක් ගාලු උරුම කේන්ද්‍රයේදී ආරම්භ කරනු ලැබීය.

### 2015.01.26 - දැනුවත් කිරීමේ වැඩසටහන

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ගාලු උරුමය පදනමේ සම්පත් දායකත්වයෙන් "ජාතික උරුමයන් හා ලංකාවේ ලෝක උරුමයන්" පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් මාතර ජනාධිපති විද්‍යාලයේදී පවත්වන ලදි. ඒ සඳහා සිසුන් 350දෙනෙකු පමණ හා ගුරුවරුන් 15දෙනෙකු පමණ සහභාගී වූහ.

### 2015.03.20 සිට 22 දක්වා - බලකොටු නගර අතර දැනුම හුවමාරු වැඩසටහන (මඩකලපුව සහ ගාල්ල)

බලකොටු නගරවල පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර දැනුම හුවමාරු අධ්‍යාපනික වැඩසහනක් ගාල්ල වක්වැල්ල කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. මෙහිදී මඩකලපුවේ සිසුන් 25ක් හා ගුරුවරුන් 05දෙනෙකුත් කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරියෙකුත් 2015 මාර්තු 20 වන දින මඩකලපුවේ සිට දුම්රියෙන් ගාල්ලට පැමිණි අතර, ගාල්ලේ පාසැල් ද 05ක සිසුන් 25ක් හා ගුරුවරුන් 05දෙනෙක් ද දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ද ඔවුන් විසින් ගාල්ල දුම්රිය ස්ථානයේදී පිළිගනු ලැබීය. බලකොටු නගර දෙකෙහිම සිසුන් එක්ව විවිධ ක්‍රියාකාරකම්වල නිරත වූ අතර, ගාල්ල හා මාතර බලකොටු නැරඹීමට අධ්‍යාපනික වශයෙන් වැදගත් කෞතුකාගාර වැනි ස්ථාන නැරඹීමටත් හා විවිධ විෂයන්ගේ දැනුම අවබෝධය ලබාදීමටත්, තරග පවත්වා ජයග්‍රාහකයින්ට ත්‍යාග ප්‍රධානය කිරීමටත්, විවිධ සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම සඳහා අවස්ථාව ලබාදීමත් සිදු කරන ලදි.



තෙදින නේවාසික වැඩසටහනක් වූ මෙය සියලු සිසුන්ගේ ජාතික සමගිය මෙන්ම විවිධ දක්ෂතාවන් මුසුවූ ක්‍රියාශීලීවූත් සුහදශීලී වුත් වැඩසටහනකි. මේ සඳහා **රු.363,525.00**ක මුදලක් විදයම් ලෙස දරා ඇත.



***<u>2015.03.29 – "දැයේ උරුමය ළමයින්ටයි වැඩසටහන"</u>***

***<u>(දහම් පාසැල් ළමුන් අතර දැනුම වර්ධනය)</u>***

කඩවත්සතර සාසනාරක්ෂක බල මණ්ඩලයේ දහම් පාසල් දරු දැරියන්ගේ චරිත වර්ධනය සඳහා පැරණි (ගද්‍ය, පද්‍ය සංග්‍රහයන්) පත පොත ආශ්‍රිතව දැනුම මිනුම තරගයක් 2015.03.29 වන දින පෙ.ව. 9.00ට ගාල්ල කළුවැල්ල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ විහාරාධිපති, කඩවත්සතර සාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී, කණුමුල්දෙණියේ චන්දවිමල නාහිමියන්ගේ අනුශාසනාව හා මූලිකත්වයෙන් ගාල්ල කළුවැල්ල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේදී පවත්වන දි. මේ සඳහා සිසුන් 80කට ආසන්න ප්‍රමාණයක් සහභාගී වූ අතර, එහිදී වැඩි පිරිසක් සතුටුදායක ලෙස ලකුණු ලබාගෙන විභාගය සමත් වීමෙන් අනතුරුව 2015.05.24 වන දින කළුවැල්ල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේදී ත්‍යාග හා සහතිකපත් ප්‍රධානෝත්සවය පවත්වන ලදි. මේ සඳහා **රු.35,412.00**ක වියදමක් දරණ ලදි.

***<u>2015.09.29 –"ඇසි දිසි ඉමෙන් එහා" වැඩසටහන (දැනුවත් කිරීමේ වැඩසටහන)</u>***

ගාලු උරුමය පදනම මගින් සංවිධානය කරනු ලබන දැනුවත් කිරිමේ දේශන මාලාවේ එක් වැඩසටහනක් ලෙස, "ඇසිදිසි ඉමෙන් එහා" වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙහි තවත් වැඩසටහනක් 2015.09.29 වන දින ගාල්ල හෝල්ඩ් ගෝල් ශාලාවේදී පවත්වන ලදි. දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහයෝගය හා අනුමැතිය ඇතිව ගාල්ල දිස්ත්‍රික්කයේ ඉතිහාසය හා ඊට සමගාමී විෂයන් හදාරන සිසු සිසුවියන්ගේ සහභාගීත්වයෙන් මෙම දැනුවත් කිරීමේ



වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා දේශනය පවත්වනු ලැබුවේ මහාචාර්ය කේ.ඩී. පරණවිතාන මහතා විසිනි. වියදම රු.**112,544.00**කි.



## ***ගාලු උරමය පදනමේ සංවර්ධන සහකාර (සැලසුම්) තරංග ලියන ආරච්චි මහතා විසින් පවත්වන ලද "ගාල්ල කොටුව සහ උරුම කළමනාකරණය" පිළිබඳ දේශන සහ දැනුවත් කිරීම්***

2015.01.27 –"ශ්‍රී ලංකා ඉන් ස්ටයිල් ට්‍රැවල් ඒජන්සි" ආයතනය මගින් ගාලු කොටුවේ සංවිධානය කරන ලද විදේශිකයන්ගේ සංචාරයේදී උරුම කළමනාකරණය පිළිබඳ දේශනයක් පවත්වන ලදි.

2015.07.08 - ගාල්ල කොටුවේ යුධ හමුදා කඳවුරේ සාමාජිකයන් සඳහා ලෝක උරුමයන් ගැන දේශනයක් පවත්වන ලදි.

2015.07.15 - බූස්ස යුධ හමුදා කඳවුරේ සාමාජිකයන් සඳහා තවත් දේශනයක් පවත්වන ලදි.

2015.10.18 - ගාල්ල සිංහ සමාජයේ සාමාජිකයන් සඳහා ලෝක උරුම ගාලු කොටුව පිළිබඳව දේශනයක් පවත්වන ලදි.

ඇල්පිටිය පොලිස් අභ්‍යාස පුහුණු ආයතනයේ නිලධාරීන් සඳහා මෙම වසරේදී අවස්ථා කිහිපයකදී ම දේශන පවත්වන ලදි.

## *7.3වෙනත් දැනුවත් කිරීම්*

ගාලු උරුමය පදනමේ ජංගම ආරක්ෂක නියාමක ශිරංග ජයසේකර මහතා විසින් ගාලු කොටුවේ ක්ෂේත්‍ර චාරිකා සමඟින් විවිධ දැනුවත් කිරීම් 25ක් මෙම වර්ෂය තුළදී සිදු කර ඇත. මෙහිදී විවිධ පාසැල්, ස්වේච්ඡා සංවිධාන, විදේශීය කණ්ඩායම්, විශ්ව විද්‍යාල කණ්ඩායම් සහ විවිධ ආයතන මෙම සේවාව ලබාගෙන ඇත.

## *2015 වර්ෂයේදී ගාලු උරුම කේන්ද්‍රයෙන් (තොරතුරු මධ්‍යස්ථානයෙන්) ලබාදුන් සේවාවන්*

කොටුව බාලදක්ෂ මාවතේ පිහිටි ගාලු උරුම කේන්ද්‍රය (තොරතුරු මධ්‍යස්ථානය) මගින් මෙම වසරේදී දේශීය හා විදේශීය පිරිස් වෙත කොටුවේ තොරතුරු ලබාදීම, කොටුවේ ක්ෂේත්‍ර චාරිකා සූදානම් කිරීම හා මාර්ගෝපදේශන සේවාවන් ලබාදීම සිදු කරන ලදි.

මෙම තොරතුරු ලබාගත් අය අතර ජපානය, ඉන්දුනීසියාව, ඕස්ට්‍රේලියාව, ඇමරිකාව, නෙදර්ලන්තය, චීනය, ඩෙන්මාර්කය, නවසීලන්තය හා ඉන්දියාව ආදී රටවලින් පැමිණි පිරිස් වන බව ඔවුන් විසින් තබා ඇති සටහන් අනුව පෙනී යයි.

පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් හා නොයෙක් අධ්‍යාපන ආයතනවල කණ්ඩායම් සඳහා "උල්පත" විමර්ශන පුස්තාකාලය මගින් දිනපතා නොමිලේ තොරතුරු ලබාදීම සිදු කරන ලදි.

# *මූල්‍ය ප්‍රගතිය*

| *විස්තරය* | *2011* | *2012* | *2013* | *2014* | *2015* |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා අමාත්‍යාංශයෙන් ලද මුදල (රු.මිලියන) | 4.0 | 5.3 | 5.4 | 8.0 | 9.0 |
| ප්‍රාග්ධන වියදම් සඳහා අමාත්‍යාංශයෙන් ලද මුදල (රු.මිලියන) | 4.5 | 2.5 | 7.5 | 7.0 | 9.0 |
| මෙහෙයුම් ආදායම (රු.මිලියන) | 1.422 | 1.749 | 2.440 | 3.991 | 4.1478 |

